# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1965/33 - 2016 මැයි මස 05 වැනි බ්‍රහස්පතින්දා - 2016.05.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත**

36(2) වගන්තිය යටතේ නිවේදනය

අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය එස්. බී. නාවින්න වන මම, 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 36 වන වගන්තියේ (2) වන උප වගන්තියෙන් මා වෙත පැවරෙන බලතල ප්‍රකාරව, ලියාපදිංචි කරන ලද ඡායාරූප ශිල්පියෙකු විසින්, ලියාපදිංචි වී හැඳුනුම්පතක් හෝ හැඳුනුම්පතක අනු පිටපතක් ලබාගැනීමට අයදුම්පතක් ඉදිරිපත් කරන තැනැත්තෙකුගේ ඡායාරූපය ගෙන එහි පිටපත් 3 ක් ලබා දීම සඳහා අය කළ යුතු උපරිම ගාස්තුව රුපියල් එකසිය පනහක මුදලකට සීමා විය යුතු බව මෙම නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරමි.

මෙම කාරණයට අදාළව 1972 පෙබරවාරි මස 18 වන දින අංක 14998 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය මෙයින් අවලංගු කරමි.

එස්. බී. නාවින්න,
අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා
සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය.

2016 මැයි මස 05 වැනි දින,
බත්තරමුල්ලේ දී ය.

05 - 614

1A - PG 2946 — 1006 (2016/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*